# 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 08 වන වගන්තිය යටතේ වන වාර්තාව -2017/2018

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

දැක්ම -

- ළමයින් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව තහවුරු කෙරෙන ඔවුන්ට හිතකර , සංවේදී සමාජයක් බිහිකිරීම

මෙහෙවර -

- ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික පදනම තුළ ළමුන් හා කාන්තාවන්ට අදාළ ජාත්‍යාන්තර ප්‍රඥප්තීන් සැලකිල්ලට ගෙන ඔවුන්ගේ අයිතිවාසිකම් පූර්ණ සංවර්ධනය ආරක්ෂාව හා සහභාගීත්වය තහවුරු කෙරෙන අන්දමේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම , පසුවිපරම් කිරීම සහ ඇගයීම සිදු කරන ජාතික යාන්ත්‍රණය ලෙස ක්‍රියාත්මක වීම

ප්‍රධාන කාර්යයන් -

- කාන්තා හා ළමා කටයුතු විෂයට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම පසු විපරම් සිදු කිරීම හා ඇගයීම
- රාජ්‍ය කටයුතු වලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම
- ගැටුම් වලින් සහ දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තා මූලික ගෘහ කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කරගනිමින් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා පියවර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඇති කිරීම
- කාන්තා හිංසනය වැළැක්වීම සඳහා නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කාන්තා හා ළමා කටයුතු වලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම
- කාන්තා ප්‍රඥප්තිය හා ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
- මුල් ළමාවිය රැකවරණය හා අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යාන්තර සම්මතයන්ට ගැලපෙන සේ සැලසුම් වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

**සේවා නියුක්ති විස්තර**

| කාර්යය මණ්ඩල වර්ගීකරණය | ජ්‍යෙෂ්ඨ මට්ටම | ද්විතියික මට්ටම | තෘතීය මට්ටම | ප්‍රාථමික මට්ටම | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය 2017 වර්ෂය | 27 | 11 | 1106 | 70 | - | 1214 |

| කාර්යය මණ්ඩල වර්ගීකරණය | ජ්‍යෙෂ්ඨ මට්ටම | ද්විතියික මට්ටම | තෘතීය මට්ටම | ප්‍රාථමික මට්ටම | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය 2018 වර්ෂය | 12 | 28 | 1157 | 57 | 56 | 1310 |

**තීරණ ගැනීමේ දී අනුගමනය කරන ක්‍රියාපටිපාටි**

- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- අමාත්‍ය මණ්ඩල තීරණ
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
- වෙනත් අමාත්‍යාංශ චක්‍රලේඛ
- අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛ
- අමාත්‍යාංශ මූල්‍ය බලතල පැවරීම්
- වෙනත් අණ පනත්

**කාර්යය කිරීමේ දී කර්තව්‍ය ඉටු කිරීමේදී සහ බලතල ක්‍රියාත්මත කිරීමේ දී භාවිත කරනු ලබන රීති, නියෝග උපදේශ අත්පොත් වෙනත් වාර්තා**

- අමාත්‍ය මණ්ඩල සංදේශ
- අමාත්‍ය මණ්ඩල තීරණ චක්‍රලේඛ
- ළමා හා කාන්තා ජාතික ප්‍රතිපත්ති, ජාතික සැලසුම්
- ගැසට් නිවේදන

**තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබාදෙන පහසුකම්**

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම
- තැපැල , විද්‍යුත් තැපැල, ෆැක්ස් පණිවුඩ මගින් හෝ වෙනත් ක්‍රම වලින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා මුද්‍රිත හෝ ඉල්ලීම් කරන මාධ්‍යයන්ගෙන් තොරතුරු ලබා දීම
- අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ලබන ප්‍රකාශන, වාර්තා, පරිහරණය සඳහා අවස්ථාව ලබා දීම

**යෝජිත වියදම් වාර්තා සහ එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය**

ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇත.

**අමාත්‍යාංශ තොරතුරු නිලධාරියාගේ නම/තනතුර/ සහ දුරකථන අංකය**

නම -ආර්.එල්.එස්.පී.ස්වර්ණලතා මිය

තනතුර - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

රාජකාරී ලිපිනය - 05 වන මහල<br>
සෙත්සිරිපාය 02 අදියර<br>
බත්තරමුල්ල

දුරකථන අංකය - 0112187274

# <u>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය</u>

**දැක්ම :**
ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම.

**මෙහෙවර :**
ළමුන් සියලූ ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම.

**ළමයින් වෙනුවෙන් වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය**

- ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපචාර වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපචාරවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපචාර වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලූ ක්‍රියා මාර්ග ගැනීම සහ උචිත අවස්ථා වලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම
- සියලූ ආකාර ළමා අපචාරවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම
- ළමා අපචාර හා සම්බන්ධ සියලූ විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාත්මක නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ගැනීම ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුලුකර ගැනීම.
- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවල දී උචිත පියවර ගැනීම.

- ළමා අපචාර පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දි ඒ පැමිණිලි නිසි බලධාරින් වෙත යොමු කිරීම.

- ළමා අපචාරවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහය වීම.

- ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම.

- අදාළ අමාත්‍යාංශවලට හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.

- ළමා අපචාර සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

- ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.

- ළමා අපචාරවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමඟ සංවාදයෙහි යෙදීම.

- ළමා අපචාර පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.

- සියලු ආකාර ළමා අපචාර අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

**සේවාවන්**

- ළමා අපචාර,හිංසන සම්බන්ධයෙන් වන පැමිණිලි සඳහා ක්‍රියාත්මක වන උපකාරක දුරකථන සේවාව (1929)
- අධ්‍යාපන ප්‍රදර්ශන හා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම
- නෛතික හා මනෝසමාජීය මැදිහත්වීම් සිදු කිරීම
- සුනාමි මාපිය කැපකරු වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- විශේෂ පොලිස් විමර්ෂණ සිදු කිරීම
- ජාතික ළමා ආරක්ෂක අරමුදල ක්‍රියාත්මක කිරීම

**සේවා නියුක්ති විස්තර**

| කාර්යය මණ්ඩල වර්ගීකරණය | ජ්‍යෙෂ්ඨ මට්ටම | ද්විතීයික මට්ටම | තෘතීය මට්ටම | ප්‍රාථමික මට්ටම | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2017 වර්ෂය | 2 | 8 | 361 | 11 | - | 382 |

| කාර්යය මණ්ඩල වර්ගීකරණය | ජ්‍යෙෂ්ඨ මට්ටම | ද්විතීයික මට්ටම | තෘතීය මට්ටම | ප්‍රාථමික මට්ටම | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2018 වර්ෂය | 6 | 13 | 349 | 11 | - | 379 |

**තීරණ ගැනීමේ දී අනුගමනය කරන ක්‍රියාපටිපාටි**

- 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක පනත : 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත
- 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත
- ළමා හා යෞවනයා ආඥා පනත (CYPO) – යුනිසෙෆ් ප්‍රකාශනය
- ළමා අපයෝජන සිදුවීමක් පිළිබඳව අපරාධ පරීක්ෂණයක් පැවැත්වීමේදී පොලිස් නිළධාරීන් විසින් පිළිපැදිය යුතු මූලධර්ම හා ගත යුතු පියවර
- ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (කෙටුම්පත)
- ළමා අපයෝජන /ළමා සැකකරුවන් පිළිබඳ වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය (කෙටුම්පත)
- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- අමාත්‍ය මණ්ඩල තීරණ
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
- වෙනත් අමාත්‍යාංශ චක්‍රලේඛ

- අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛ
- අමාත්‍යාංශ හා ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය බලතල පැවරීම්
- වෙනත් අණ පනත්

**කාර්යය කිරීමේ දී කර්තව්‍ය ඉටු කිරීමේදී සහ බලතල ක්‍රියාත්මත කිරීමේ දී භාවිත කරනු ලබන රීති, නියෝග උපදේශ අත්පොත් වෙනත් වාර්තා**

- අමාත්‍ය මණ්ඩල සංදේශ
- අමාත්‍ය මණ්ඩල තීරණ චක්‍රලේඛ
- ළමා හා කාන්තා ජාතික ප්‍රතිපත්ති, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් අනුමත සැලසුම්
- ගැසට් නිවේදන

**තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබාදෙන පහසුකම්**

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම
- තැපැල , විද්‍යුත් තැපැල, ෆැක්ස් පණිවුඩ මඟින් හෝ වෙනත් ක්‍රම වලින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා මුද්‍රිත හෝ ඉල්ලීම් කරන මාධ්‍යයන්ගෙන් තොරතුරු ලබා දීම
- අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ලබන ප්‍රකාශන, වාර්තා, පරිහරණය සඳහා අවස්ථාව ලබා දීම

**යෝජිත වියදම් වාර්තා සහ එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය**

ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇත.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු නිලධාරියාගේ නම/තනතුර/ සහ දුරකථන අංකය**

- නම- අනෝමා සිරිවර්ධන මිය

  තනතුර - අධ්‍යක්ෂ ජනරාල්

  රාජකාරී ලිපිනය - නො 330

  තලවතුගොඩ පාර

  මාදිවෙල

  දුරකථන අංකය - 0112778911

# ජාතික කාන්තා කමිටුව

**දැක්ම**
සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකීය සමාජයක්

**මෙහෙවර**
ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම සඳහා නිර්දේශ හා සහාය ලබා දීම සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම හා අධීක්ෂණය කර ඇගයීම.

**ප්‍රධාන කාර්යභාරය**

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇති වන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි පිළිගැනීම, සංනිරීක්ෂණය හා ඒවා අදාල පාලක, බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම.
- අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වන පැමිණිලි, සහන, නෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන සංවිධාන වෙත යොමු කිරීම.
- එම ක්‍රියාමාර්ග සමීක්ෂණය, අදාල පාලන බලධාරීන්ගෙන් වාර්ෂික ප්‍රගති වාර්තා ලබාගැනීම සහ එම වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථා සැලසීම.
- ප්‍රඥප්තියේ අන්තර්ගතව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් සහ වගකීම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්තිවලින් ඇතිවන බලපෑම ඇගයීම.
- අදාළ පර්යේෂණ දිරිගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම සහ ඒ පර්යේෂණ පදනම් කර ගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විෂයභාර අමාත්‍යවරයා/ඇමතිනිය විසින් කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳව හෝ උචිතයැයි කමිටුව සිතන කටයුතු කිරීමට උපදෙස් දීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පැමිණිලි මධ්‍යස්ථානයේ කාර්යභාරයේ ප්‍රසාරණය වීමක් වශයෙන් 2014 වර්ෂයේ ආරම්භ කරන ලද 1938 කාන්තා උපකාරක දුරකථන සේවය දැක්විය හැකි අතර ලැබෙන පැමිණිලි සහන, නෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන සංවිධාන වෙත යොමු කිරීම.
- කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ පැවරී ඇති ව්‍යාපෘතීන් හා ක්‍රියාකාරකම් දියත් කිරීම .

**තීරණ ගැනීමේ දී අනුගමනය කරන ක්‍රියාපටිපාටි**

- කාන්තාවන්ට වන සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය (CEDAW)
- කාන්තා ප්‍රඥප්තිය
    - ආයතන සංග්‍රහය
    - මුදල් රෙගුලාසි
    - අමාත්‍ය මණ්ඩල තීරණ
    - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
    - වෙනත් අමාත්‍යාංශ චක්‍රලේඛ
    - අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛ
    - අමාත්‍යාංශ මූල්‍ය බලතල පැවරීම්
    - වෙනත් අණ පනත්

**කාර්යය කිරීමේ දී කර්තව්‍ය ඉටු කිරීමේදී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරනු ලබන රීති, නියෝග උපදේශ අත්පොත් වෙනත් වාර්තා**

- අමාත්‍ය මණ්ඩල සංදේශ
- අමාත්‍ය මණ්ඩල තීරණ/ චක්‍රලේඛ
- ළමා හා කාන්තා ජාතික ප්‍රතිපත්ති, ජාතික සැලසුම්
- ගැසට් නිවේදන

**තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබාදෙන පහසුකම්**

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම
- තැපැල , විද්‍යුත් තැපැල, ෆැක්ස් පණිවුඩ මගින් හෝ වෙනත් ක්‍රම වලින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා මුද්‍රිත හෝ ඉල්ලීම් කරන මාධ්‍යයන්ගෙන් තොරතුරු ලබා දීම
- අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ලබන ප්‍රකාශන, වාර්තා, පරිහරණය සඳහා අවස්ථාව ලබා දීම

**යෝජිත වියදම් වාර්තා සහ එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය**

ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇත.

**ජාතික කාන්තා කමිටුවේ තොරතුරු නිලධාරියාගේ නම/තනතුර/ සහ දුරකථන අංකය**

නම- අනුලා ඉන්ද්‍රාණි මිය

තනතුර - විධායක අධ්‍යක්ෂ

රාජකාරී ලිපිනය - 05 වන මහල
සෙත්සිරිපාය 02 අදියර
බත්තරමුල්ල

දුරකථන අංකය - 0112187257

## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

දැක්ම

ශ්‍රී ලාංකේය ජන සමාජය උදෙසා තීක්ෂණ, සංවේදී හා විශ්වාසයෙන් යුතු කාන්තා පරපුරක් නිර්මාණය කරන ජාතික ආයතනය බවට පත්වීම

මෙහෙවර

සිය බුද්ධිය ද ශක්තිය ද උපරිම හා යහපත් ලෙස භාවිත කරමින් , ස්වශක්තියෙන් අභියෝගයන්ට මුහුණ දෙන ශ්‍රී ලාංකික කාන්තා පරපුරක් සහ උචිත පරිසරයක් නිර්මාණය කිරීමට විධිමත් සංවිධාන රාමුවක් ඔස්සේ සැලසුම් සහගත වූ දැනුවත් බව ලබා දෙමින් සිදු කෙරෙන සාමාජීය හා ආර්ථික බලගැන්වීම් මඟින් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කාන්තා අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක වන ජාතික යාන්ත්‍රණය බවට පත්වීම

වැඩසටහන්

- ආර්ථික සංවර්ධන වැඩසටහන්

  ගෘහ මූලික කාන්තාවන් සඳහා ස්වයං රැකියා ලබා දීම

  දිරිය මංපෙත වැඩසටහන

  විදේශ ගතවන කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

  වතු අංශයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

  දිවියට අරුතක් වැඩසටහන

  ගිණුම් පුහුණු වැඩසටහන්

  චක්‍රීය ණය යෝජනා ක්‍රමය

  වනිතා ශක්ති අරමුදල

  තත්ත්ව හා විකුණුම් කළමනාකරණ වැඩසටහන්

  කාන්තාවන්ගේ අත්කම් නිර්මාණ වෙළඳපොළ සහ ප්‍රදර්ශන පැවැත්වීම

  තිරසාර කෘෂි වැඩසටහන

  වැන්දඹු කාන්තා සංවර්ධන ජාතික ඒකකය පවත්වාගෙන යාම (කිලිනොච්චිය)

  ආහාර නිෂ්පාදන සඳහා නිෂ්පාදන අලෙවි පොළ ස්ථාපිත කිරීම(ලිය ශක්ති රස බොජුන් හල්)

- **සාමාජීය සංවර්ධන වැඩසටහන්**

    රැකවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම

    උපදේශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම

    යොවුන් වසන්තයට අරුත්බර හෙටක් වැඩසටහන

    සාධනීය මිතුරු ගමක් වැඩසටහන

    උපදේශන වැඩසටහන්

**තීරණ ගැනීමේ දී අනුගමනය කරන ක්‍රියාපටිපාටි**

- කාන්තාවන්ට වන සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය (CEDAW)
- කාන්තා ප්‍රඥප්තිය
- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- අමාත්‍ය මණ්ඩල තීරණ
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
- වෙනත් අමාත්‍යාංශ චක්‍රලේඛ
- අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛ
- අමාත්‍යාංශ මූල්‍ය බලතල පැවරීම්
- වෙනත් අණ පනත්

**කාර්යය කිරීමේ දී කර්තව්‍ය ඉටු කිරීමේදී සහ බලතල ක්‍රියාත්මත කිරීමේ දී භාවිත කරනු ලබන රීති, නියෝග උපදේශ අත්පොත් වෙනත් වාර්තා**

- අමාත්‍ය මණ්ඩල සංදේශ
- අමාත්‍ය මණ්ඩල තීරණ චක්‍රලේඛ
- ළමා හා කාන්තා ජාතික ප්‍රතිපත්ති, ජාතික සැලසුම්
- ගැසට් නිවේදන

**තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබාදෙන පහසුකම්**

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම
- තැපැල , විද්‍යුත් තැපැල, ෆැක්ස් පණිවුඩ මගින් හෝ වෙනත් ක්‍රම වලින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා මුද්‍රිත හෝ ඉල්ලීම් කරන මාධ්‍යයන්ගෙන් තොරතුරු ලබා දීම
- අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ලබන ප්‍රකාශන, වාර්තා, පරිහරණය සඳහා අවස්ථාව ලබා දීම

**යෝජිත වියදම් වාර්තා සහ එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය**

ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇත.

**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ පත්කොට ඇති තොරතුරු නිලධාරියාගේ නම/තනතුර/ සහ දුරකථන අංකය**

- නම- චම්පා උපසේන මිය

  තනතුර - අධ්‍යක්ෂ

  රාජකාරී ලිපිනය - 03 වන මහල

  සෙත්සිරිපාය 02 අදියර

  බත්තරමුල්ල

  දුරකථන අංකය - 0112187270

## ළමා ලේකම් කාර්යාලය

**දැක්ම-**

ශාරීරික , මනෝසමාජීය සහ ප්‍රජානන සංවර්ධනයෙන් යුතු ශ්‍රී ලාංකේය මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම

මෙහෙවර

ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මතක කිරීම ඇගයීම හා පසුවිපරම් කිරීම තුළින් ශ්‍රී ලාංකේය මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම

වැඩසටහන්

- ගැබිණි මව්වරුන් සඳහා  වන පෝෂණ මල්ල වැඩසටහන
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාරවේල ලබා දීමේ වැඩසටහන
- ළමයින්ගේ පෝෂණය සම්බන්ධයෙන් මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංවර්ධනය
- ළමා දිරිය වැඩසටහන
- මුල් ළමා විය සංවර්ධනය ආශ්‍රිත වැඩසටහන්
- සෙනෙහෙ තටාක වැඩසටහන

**තීරණ ගැනීමේ දී අනුගමනය කරන ක්‍රියාපටිපාටි**

- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- අමාත්‍ය මණ්ඩල තීරණ
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
- වෙනත් අමාත්‍යාංශ චක්‍රලේඛ
- අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛ
- අමාත්‍යාංශ මූල්‍ය බලතල පැවරීම්
- වෙනත් අණ පනත්

**කාර්යය කිරීමේ දී කර්තව්‍ය ඉටු කිරීමේදී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරනු ලබන රීති, නියෝග උපදේශ අත්පොත් වෙනත් වාර්තා**

- අමාත්‍ය මණ්ඩල සංදේශ
- අමාත්‍ය මණ්ඩල තීරණ චක්‍රලේඛ
- ළමා හා කාන්තා ජාතික ප්‍රතිපත්ති, ජාතික සැලසුම්
- ගැසට් නිවේදන

**තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබාදෙන පහසුකම්**

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම
- තැපැල , විද්‍යුත් තැපැල, ෆැක්ස් පණිවුඩ මඟින් හෝ වෙනත් ක්‍රම වලින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා මුද්‍රිත හෝ ඉල්ලීම් කරන මාධ්‍යයන්ගෙන් තොරතුරු ලබා දීම
- අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ලබන ප්‍රකාශන, වාර්තා, පරිහරණය සඳහා අවස්ථාව ලබා දීම

**යෝජිත වියදම් වාර්තා සහ එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය**

ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇත.

**ළමා ලේකම් කාර්යාලයේ තොරතුරු නිලධාරියාගේ නම/තනතුර/ සහ දුරකථන අංකය**

- නම- නයනා සේනාරත්න මිය

  තනතුර - අධ්‍යක්ෂ

  රාජකාරී ලිපිනය - 06 වන මහල

  සෙත්සිරිපාය 02 අදියර

  බත්තරමුල්ල

  දුරකථන අංකය - 0112186054

## <u>සංවර්ධන අංශය</u>

**කාර්යභාරය**

අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයභාරය වන්නේ කාන්තාවන්ගේ හා දරුවන්ගේ අයිතිවාසිකම් හා සංවර්ධනය තහවුරු කෙරෙන ඔවුනට හිංසනයෙන් තොරව ජීවත්වීමේ පරිසරයකින් යුතු සංවේදී සමාජයක් බිහි කිරීම උදෙසා අමාත්‍යාංශය යටතේ ඇති සියළු ආයතන හා අංශ මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය, ළමා හා කාන්තා සංවර්ධනයට අදාල ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම සිදු කිරීම

එසේම අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට පත් කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධීකරණය කරමින් පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීයව සිදු කරන ළමා හා කාන්තා සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන වලින් ලැබෙන ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද එම සංවිධාන හා අමාත්‍යාංශයේ අනෙකුත් අංශ සම්බන්ධීකරණය කිරීම

**ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්**

- පාරිසරික සංචාරක කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා කාන්තාවන් දිරිගැන්වීම සහ ඔවුන් සවිබල ගැන්වීම
- ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවය සංවිධානය කිරීම
- මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- තොරතුරු තාක්ෂණ ඒකකය පවත්වාගෙන යාම
- ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන

  අමාත්‍යාංශ මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණ වැඩසටහන් ස්ථාපනය කිරීම
- කාන්තාවන්ට හිතකාමී හා උපකාරී ආදර්ශ ගම්මාන වැඩසටහන
- ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේ විශේෂ වැඩසටහන

  පොලිස් ළමා කාන්තා කාර්යාංශ ශක්තිමත් කිරීම

  කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම

  ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් වැළැක්වීම හා ඊට ප්‍රතිචාර දැක්වීම

  අපරාධ හා හිංසනයන්ට පත් වූ වින්දිතයන් සඳහා තාවකාලික රැඳවුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම

- ප්‍රජනන සෞඛ්‍ය සඳහා ඇති හිමිකම ප්‍රවර්ධනය  හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික සහ සිවිල් සමාජ/ සංවිධානවල ධාරිතාව  ශක්තිමත් කිරීම (UNFPA )

  ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට හා පීඩාවට පත්වන්නන් සඳහා සේවාවන් සැපයීමට අදාලව රාජ්‍ය හා රාජ්‍ය නොවන යාන්ත්‍රණය වෙත යොමු කිරීම

- ග්‍රාමීය ආර්ථික  සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ආයෝජනයන්ගෙන් 25% කාන්තාවන් උදෙසා යෙදවීම

  කාන්තා ගෘහමූලික පවුල් සඳහා වන ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීම

  කාන්තාවන්ට වන සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාත්මක කිරීම (CEDAW)

**තීරණ ගැනීමේ දී අනුගමනය කරන ක්‍රියාපටිපාටි**

- කාන්තාවන්ට වන සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය  (CEDAW)
- කාන්තා ප්‍රඥප්තිය
- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- අමාත්‍ය මණ්ඩල තීරණ
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
- වෙනත් අමාත්‍යාංශ චක්‍රලේඛ
- අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛ
- අමාත්‍යාංශ මූල්‍ය බලතල පැවරීම්
- වෙනත් අණ පනත්

**කාර්යය කිරීමේ දී කර්තව්‍ය ඉටු කිරීමේදී   සහ බලතල ක්‍රියාත්මත කිරීමේ දී  භාවිත කරනු ලබන රීති, නියෝග උපදේශ අත්පොත්  වෙනත් වාර්තා**

- අමාත්‍ය මණ්ඩල සංදේශ
- අමාත්‍ය මණ්ඩල තීරණ චක්‍රලේඛ
- ළමා හා කාන්තා ජාතික ප්‍රතිපත්ති, ජාතික සැලසුම්
- ගැසට් නිවේදන

**තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබාදෙන පහසුකම්**

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම
- තැපැල , විද්‍යුත් තැපැල, ෆැක්ස් පණිවුඩ මඟින් හෝ වෙනත් ක්‍රම වලින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා මුද්‍රිත හෝ ඉල්ලීම් කරන මාධ්‍යයන්ගෙන් තොරතුරු ලබා දීම
- අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ලබන ප්‍රකාශන, වාර්තා, පරිහරණය සඳහා අවස්ථාව ලබා දීම

**යෝජිත වියදම් වාර්තා සහ එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය**

ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇත.